# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය**

ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය
(1984 අංක 18 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද්දකි)

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මෙහෙයවන 2008 වර්ෂය සඳහා ඕෆ්සෙට් මුද්‍රණ පාඨමාලා**

ශ්‍රී ලංකාවේ මුද්‍රණ ක්ෂේත්‍රයට අදාළ පාඨමාලා හඳුන්වාදීමේ අද්විතීය ස්ථානයක් ලබා සිටින ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය යටතේ පැවැත්වෙන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මගින් 2008 වර්ෂය සඳහා ඕෆ්සෙට් මුද්‍රණ ක්ෂේත්‍රයට (Offset Printing ) අදාළ පහත සඳහන් පාඨමාලා හඳුන්වා දෙයි.

2008 අගෝස්තු මාසයේ දී ආරම්භ කිරීමට නියමිත මෙම පාඨමාලාවලට අයැදුම්පත් කැඳවීම දැන් ආරම්භ කර ඇත. මෙම පාඨමාලාවට ඇතුළත් කිරීම සීමා කෙරෙන අතර තෝරා ගැනීම සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව සිදු කෙරේ.

01. ඕෆ්සෙට් පත්ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
(Certificate Course in Sheet Fed Litho Press Operations)

මෙම පාඨමාලාව තුළින් පත් ලිතෝයන්ත්‍ර ක්‍රියාකරණය (Sheet Fed Litho Press Operations) පිළිබඳ පුළුල් අවබෝධයක් හා මනා ප්‍රායෝගික පුහුණුවක් ලබා දේ.

මාස 8 ක පමණ කාලයක් පුරා සිංහල මාධ්‍යයෙන් පැවැත්වෙන මෙම අර්ධ කාලීන පාඨමාලාව න්‍යායාත්මක හා ප්‍රායෝගික පංතිවලින් සමන්විත වේ.

මෙම පාඨමාලාව ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට මෙන්ම මුද්‍රණ ක්ෂේත්‍රයට ඇතුළත් වීමට උනන්දුවක් දක්වන නවකයන්ටද සුදුසු වන අයුරින් පාඨමාලා සම්පාදනය කොට ඇත.

**පාඨමාලා අන්තර්ගතය**

Basic Principles of Offset Lithography
Introduction to Pre press
Plates and blankets
Damping and linking systems
Paper and ink requirements
Cylinder paking and pressure control
Press register system and control
Press tubleshooting
Improvement of quality in sheet fed colour printing
New technological developments in the Printing Industry
පාඨමාලා ගාස්තු රු. 11,500

**දෙවර්ණ ස්ට්‍රීම් ෆීඩර් යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව (අර්ධ කාලීන)**

**Training Course in Two Colour Stream Feeder Litho Machine Operations (Part time)**

1984 අංක 14 දරන පාර්ලිමේන්තු පනත යටතේ පිහිටුවා ඇති ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය දැනට මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැලි පත් ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරුවන් (Sheet-fed Offset Machine Operators) සඳහා මෙම පාඨමාලාව හඳුන්වා දෙයි.

තනි වර්ණ පත් ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරුවන් කොපමණ සිටියත් ඔවුන් අතරින් දක්ෂ දෙවර්ණ ස්ට්‍රීම් ෆීඩර් යන්ත්‍ර ක්‍රියාකරුවන් සිටින්නේ කලාතුරකිනි.

මෙම පාඨමාලාව තුළින් ක්‍රමවත්ව දෙවර්ණ ස්ට්‍රීම් ෆීඩර් යන්ත්‍ර ක්‍රියා කොට වැඩි ඵලදායිතාවයක් කෙටි කාලයක දී ලබා ගන්නා අයුරු න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව පංති කීපයකින් පැහැදිලි කර දෙනු ලැබේ.

එක් කණ්ඩායමකට බඳවා ගනු ලබන්නේ 8 දෙනෙක් පමණක් වන අතර 2008 අගෝස්තු මස මෙම පාඨමාලාව ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

*අරමුණ* .- පත් ලිතෝ යන්ත්‍රකරුවන්ට දෙවර්ණ ස්ට්‍රීම් ෆීඩර් යන්ත්‍රවල ක්‍රියාකාරිත්වය පිළිබඳ විධිමත් න්‍යායාත්මක හා ප්‍රයෝගික පුහුණුවක් මෙම පාඨමාලාව තුළින් ලබාදීම.

පුහුණු කාලය මාස 2 යි. ඃ

A කණ්ඩායම - සෙනසුරාදා පෙ. ව. 8.30 සිට ප. ව. 12.30 දක්වා
B කණ්ඩායම - සෙනසුරාදා ප. ව. 1.30 සිට ප. ව. 5.30 දක්වා
අවම සුදුසුකම් - පත් ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳ මනා අවබෝධය
මාධ්‍යය - සිංහල
පාඨමාලා ගාස්තු - රු. 9,000

මෙම පාඨමාලාව සඳහා තෝරාගනු ලබන්නේ සීමිත සංඛ්‍යාවක් පමණි.
පාඨමාලා අන්තර්ගතය:

* දෙවර්ණ, ස්ට්‍රීම් ෆීඩර් ලිතෝ යන්ත්‍ර පිළිබඳ පූර්ණ අවබෝධය හා දැනුම
* යන්ත්‍ර භාවිතය, ක්‍රියාකාරිත්වය පිළිබඳ පූර්ණ අවබෝධය හා දැනුම
* පාලක පද්ධතිය
* ෆීඩර් හා ඩිලිවරි පද්ධතිය
* අංග, උපාංග සහ ඒවායේ ක්‍රියාකාරිත්වය
* ෆීඩරය සහ ඩිලිවරිය ක්‍රමානුකූලව සකස් කිරීම
* කෙටි කාලයක් තුළ මුද්‍රණ ආරම්භක සැකසුම
* මුද්‍රණ තීන්ත පද්ධතිය සකස් කිරීම
* ජල පද්ධතිය සකස් කිරීම
* බ්ලැන්කට් සහ පැකින් සකස් කොට අවශ්‍ය පීඩක බලය ලබාදීම
* දෙවර්ණ මුද්‍රණයේ මුහුණ පාන ගැටළු සහ විසඳුම්
* අවම මුද්‍රණ කාලයක් තුළ තත්ත්වයෙන් උසස් වර්ණ මුද්‍රණය කිරීමේ ප්‍රායෝගික පංති මාලාව.

විමසීම් ඃ ලේඛකාධිකාරි,
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 08.

දුරකථන අංක ඃ 2686162/2679791
ෆැක්ස් අංක ඃ 2686162
ඊ-මේල් ඃ sliopreg@sltnet.lk

07-393

